# Trial Monitoring report

**About the case:** වනාතවිල්ලුව ලැක්ටෝවත්තෙහි පුපුරණ ද්‍රව්‍ය සොයා ගැනීම හා සම්බන්ධ නඩුව

**Case no. : HC 107/21 (TAB)**

**Courts:** පුත්තලම මහාධිකරණය

**Date of hearing: 2024.10.22**

**Author (s) of report:** සුමිරි ප්‍රනාන්දු

## 1. Who was in courts:

| Who | Names / other information | Comments |
|---|---|---|
| Judge (s) | විනිසුරු නිශාන්ත හපුආරච්චි මහතා<br>විනිසුරු හසිත සමන් පොන්නම්පෙරුම මහතා<br>විනිසුරු නයෝමි වික්‍රමසේකර මිය | |
| Attorney General's Dept. | ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ උදාර කරුණාතිලක<br>ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ සජිත් බණ්ඩාර<br>රජයේ අධිනීතිඥ වසනා තිසේරා | |
| Police (CID / TID etc.) | CID Colombo/ TID | |
| Accused / Suspects | 1.අබු හනීෆා මොහොමඩ් මුෆිස් හෙවත් අබු දහිදා<br>2.අමීර් හම්සා මොහොමඩ් හමාස් හෙවත් අබු සාෆියා<br>3.මොහොමඩ සරීෆු ආදම්ලෙබ්බෙ /ගෆූර් මාමා / ගෆූර් නානාහෙවත් අබු හදීද්<br>4.මොහොමඩ ඊබ්‍රහිම් සාදික් අබ්දුල්ලා හෙවත් සාදික් හෙවත්ත් සාදික අබ්දුල්ලා හෙවත් අබු උමර්<br>5. මොහොම්මදු ඊබ්‍රහිම් මොහොම්මදු හෙවත් නවුෆර් මවුලවි හෙවත් අබු සෙයිද්<br>6. මොහොමඩ් රමීෂ් මොහොමඩ් සාජිද් හෙවත් සාජිද් මවුලවි හෙවත් අබු නජා | |
| Lawyers for accused / suspects | 1,2,4 නීතිඥ සජාඩ් මහතාගේ උපදෙස් මත නීතිඥ රුෂ්ඩි හබීබ් මහතා.<br><br>3 වන චූදිත වෙනුවෙන් නීතීඥ ඒ.එච්.එම් | |

| | | |
|---|---|---|
| | අල්ලතාෆ් මහතා<br><br>5 වන චූදිත වෙනුවෙන් නීතීඥ අද්නාද් ෆසාල් මහතාගේ උපදෙස් මත නීතීඥ ඒ.එච්.එම් අල්ලතාෆ් මහතා<br><br>6 වන චූදිත වෙනුවෙන් නීතීඥ ගසාලි හුසේන් මහතාගේ උපදෙස් මත නීතීඥ සජාඩ් මහතා | |
| **Aggrieved party** | - | |
| **Lawyers for aggrieved party** | - | |
| **Supporters of accused / suspects** | | |
| **Supporters of aggrieved party** | - | |
| **Others** | - | |

## 2. What happened in court hearing?

සාක්ෂිකරුගේ සාක්ෂි දමිල බසින් විවෘත අධිකරණයේ කියවා එය දමිල බසින් ද සටහන් කර ගැනීමට රජයේ අධිනීතිඥ විසින් ඉල්ලීමක් සිදු කරන ලද අතර එකී ඉල්ලීම මත කටයුතු කරන ලදී.

3 වන සාක්ෂිකරුගේ ස්වෙච්චානුගතභාවය සම්බන්ධ අතුරු පරීක්ෂණය හා සමගාමීව සාක්ෂි විමසීම ආරම්භ කරමින් පැමිණිල්ලේ **සාක්ශි අංක 53 පොලිස් පරීක්ෂක ගුණවර්ධන** යන අයට සාක්ෂියට කැඳ වූ අතර ඔහු 2020 අප්‍රියෙල් මාසයේ අපරාධ පරීෂණ දෙපාර්තුමේන්තුවේ රාජකාරි කළ බව කියා සිටියා. තව ද එම සාක්ෂිකරු දැනට අපරාධ පරීෂණ දෙපාර්තුමේන්තුවේ විශේෂ අංශයේ ස්ථානාධිපති ලෙස කටයුතු කරන අතර 2020 වසරේදී ඔහු අපරාධ පරීෂණ දෙපාර්තුමේන්තුවේ විශේෂ අංශයේ පොලිස් පරීක්ෂක ලෙස කටයුතු කර ඇත.

මෙහිදී පැමිණිල්ල වෙනුවෙන් රජයේ අධිනීතිඥ උදාර කරුණාතිලක මහතා සාක්ෂිකරු අපරාධ පරීෂණ දෙපාර්තුමේන්තුවේ රාජකාරි කළ කාල වකවානුව හා අපරාධ පරීෂණ දෙපාර්තුමේන්තුවේ සේවයට අනුයුක්ත වූ කාලය සම්බන්ධව විමසීමෙන් අනතුරුව පාස්තු ප්‍රහාරයට සමගාමීව 2020/04/27 වන දින අත්තඩංගුවට පත් වූ 3 වන චූදිත සම්බන්ධ විමර්ෂණය සිදු කළ ආකාරය විමසනු ලැබුවා. එහිදී 3 වන චූදිතගෙන් සාක්ෂි ලබාගත් ආකාරය, චූදිත රඳවා තබාගෙන සිටි කාලයේ චූදිතට අවශ්‍ය පහසුකම් ලබා දුන් ආකාරය, චූදිතව කොළඹ ජාතික රෝහලට ගෙනගිය දිනය, එලෙස පිට වී යාමේ දී පිටවීමේ සටහන් සහ නැවත අපරාධ

පරීක්ෂණ දෙපාර්තුමේන්තුවට ගෙන ඒම සම්බන්ධව පිටවීමේ සහ ඇතුල් වීමෙ සටහන්, අපරාධ පරීෂණ දෙපාර්තුමේන්තුවේ විශේෂ අංශයේ කටයුතු සම්බන්ධව අපරාධ පරීෂණ දෙපාර්තුමේන්තුවේ මෙහෙයුම් අංශයේ කාර්යභාරය, නැවත චූදිතව අපරාධ පරීෂණ දෙපාර්තුමේන්තුවේ විශේෂ අංශයට රැගෙන එන අවස්තාවේ ඇතුල් වීමේ සටහන් දැමූ ආකාර, සටහන් දැමූ දින හා වේලාව, 3 වන චූදිතගේ ප්‍රකාශ සටහන් කරගත් වෙලාව හා දිනය, කුමන නිළධරයෙකුගේ උපදෙස් මත 3 වන චූදිත සම්බන්ධ විමර්ෂණ සාක්ශිකරු ඇරඹුයේද යන්න මූලික සාක්ශි මගින් අණාවරනය කර ගන්න ලදී.

තවද අධිකරණ වෛද්‍ය පරීක්ෂණ පෝරමය 45/2020-**X5** ලෙස ද, හා වෛද්‍ය පරීක්ෂණ පෝරමය 46/2020- **X6** ලකුණු කරන ලදී.

මෙහිදී මේ සම්බන්ධව 3 වන චූදිත වෙනුවෙන් හරස් ප්‍රශ්න ඇසූ අතර එහිදී 3 වන චූදිත වෙනුවෙන් නීතිඥ ඒ.එච්.එම් අල්තාෆ් පහත කරුණු යෝජනා කරන ලදි. එනම්,

1. සාක්ශිකරුට ඕන වෙලාවක ඕන සටහනක් යෙදි හැකි බවත්,
2. සාක්ශිකරු හිජාස් හිස්බුල්ලා මහත්මයා සම්බන්ධයෙන් කටඋත්තරක් ලගන්න ඕනා කියලා ඒ මුවාවෙන් 3වන චූදිතගෙන් පාපුච්චාරණයක් ලබා ගැනීමට කටයුතු කල බවත්,
3. සැකකරු ලියාගෙන සිටින ප්‍රකාශය කුමක්ද යන්න 3 වන චූදිත සාක්ෂිකරුගෙන් විමසා සිටි බවටත්,
4. 3 වන චූදිත තම කටඋත්තර දමිල බසින් සටහන් කර ගන්න කියා සාක්ෂිකරුගෙන් ඉල්ලා සිටි බවත්,
5. සාක්ෂිකරු, සහකාර පොලිස් අධිකාරි උපුල් සෙනවිරත්න සමග එක්ව 3 වන චූදිතට කෲර සහ අමානුෂික ලෙස පහර දී එකී කටයුත්තට අත්සන් ලබා ගත් බවටත්,
6. 3 වන චූදිත රැගෙන අපරාධ පරීෂණ දෙපාර්තුමේන්තුව වෙත රැගෙන ගොස් සහකාර පොලිස් අධිකාරි උපුල් සෙනවිරත්න අයට 3 වන චූදිතට පහර දීමට ඉඩ සැලසූ බවටත්,
7. සාක්ෂිකරු, සහකාර පොලිස් අධිකාරි උපුල් සෙනවිරත්න සමග එක්ව 3 වන චූදිතගේ දුවගේ නිරුවත් ඡායාරූප පෙන්වා බිය ගන්වා ඔහුව මානසිකව වට්ටවා3 වන චූදිතගෙන් කටඋත්තරයට අත්සන් ලබාගත් බවටත්,

මේ සම්බන්ධව 4 වන චූදිත වෙනුවෙන් හරස් ප්‍රශ්න ඇසූ අතර එහිදී 4 වන චූදිත වෙනුවෙන් නීතිඥ රුෂ්ඩි හබීබ් මහතා පහත කරුණු යෝජනා කරන ලදි.එනම්,

1. මෙහෙයුම් මැදිරිය වැසූ පසු එදින රාජකාරියට ගිය නිළධාරීන්ට නැවත තම අංශයට පැමිණ මෙහෙයුම් මැදිරියේ සටහන් පොතේ සටහන් දැමීමට අවකාශය ලැබෙන්නේ නොමැති බවටත්,
2. පෙර දවසේ කරන ලද රාජකාරියට අදාලව පසු දිනයේ පෙර දිනය දමා සටහන් යොදන්න හැකියාව තිබෙන බවත්,
3. 2020/04/28 වන දින සටහන් යෙදීමේ හැකියාවක් තියෙනවා 2020/04/27 රාජකාරී කල බවටත්,

4. 2024/04/27 වන දින 3 වන චූදිතගෙන් ප්‍රකාශයක් හෝ පාපොච්චාරණයක් ලබා නොගත් නිසාවෙන් ඒ සම්බන්ධව පොත් වල සඳහනක් නොමැති බවත්,
5. 2024/04 27 හෝ 28 යන දින දෙකෙන් එකවත් 3 වන චූදිතගෙන් පාපෙච්චාරණයල් ලබා නොගත් බවටත් ය.

තවද 4 වන චූදිත වෙනුවෙන් නීතිඥ රුෂ්ඩි හබීබ් මහතා පෙර දිනයක් සාක්ෂි ලබා දුන් වික්‍රම ආරච්චි යන අය විසින් යොදන ලද සටහන් වල අන්තර්ගතය සම්බන්ධව මෙම සාක්ෂිකරුගෙන් ප්‍රශ්න ඇසීමට යාමේදී එම සාක්ෂි ප්‍රවාදක සාක්ෂි වන බැවින් ඊට රජයේ අධි නීතිඥ උදාර කරුණාතිලක මහතා සිය විරෝධත්වය ගොනු කරන ලදී. මන්දයත් සාක්ෂි ආඥා පනත ප්‍රකාරව ප්‍රවාදක සාක්ෂි කෙතරම් ප්‍රයෝජනවත් වූවත් එකී සාක්ෂි, සාක්ෂි ආඥා පණතේ වගන්ති 17-35 යටතේ වූ ව්‍යතිරේක වලට නොවැටෙන නිසාවෙනි.
තවද 4 වන චූදිත වෙනුවෙන් නීතිඥ රුෂ්ඩි හබීබ් මහතාට එකී වික්‍රම ආරච්චි යන අය විසින් යොදන ලද සටහන් වල අන්තර්ගතය සම්බන්ධව වික්‍රමආරච්චි යන සාක්ශි දීමට පැමිණි දිනයේ ඕනෑ තරමින් හරස් ප්‍රශ්න ඇසීමට හැකියාව තිබිය දී ඒ සම්බන්ධව හරස් ප්‍රශ්න නොනැගූ බවටද චෝදනා කරන ලදී. ඒ අනුව ගරු අධිකරණය මගින් එකී ප්‍රවාදක සාක්ෂි ලබා ගැනීම සම්බන්ධව නීතිඥ රුෂ්ඩි හබීබ් මහතාට අවසර නොදෙන ලදී.

ඉන් පසු නැවතත් රජයේ අධිනීතිඥ උදාර කරුණාතිලක මහතා මෙහෙයුම් මැදිරියේ හා සාක්ෂිකරුගේ ඒකකයේ සටහන් පොත්, පිටවීමේ ඇතුල් වීමේ සටහන් යොදන ආකාරය විමසන ලද අතර ඊට වැඩිමනක් වශයෙන් අපරාධ පරීෂණ දෙපාර්තුමේන්තුවෙන් ආයුධ රැගෙන යන විට මෙහෙයුම් මැදිරියේ අත්‍යවශ්‍ය සටහන් යොදන ආකාරය සම්බන්ධවත් සාක්ෂි සටහන් කර ගන්නා ලදී.

3 වන චූදිතගේ ස්වෙච්චානුගතභාවය සම්බන්ධ අතුරු පරීක්ෂණයට වෙනත් සාක්ෂිකරුවන් නොගෙන්වන බවට ගරු අධිකරනයට රජයේ අධිනීතිඥ තුමා දැනුම් දුන් බැවින් ඉදිරි දිනය, 3 වන චූදිතගේ ස්වෙච්චානුගතභාවය සම්බන්ධ නියෝගයට තබන ලදී.

තවද 3 වන චූදිතගේ ස්වෙච්චානුගතභාවය හා බැදි අතුරු පරීක්ෂණය සම්බන්ධව යම් පාර්ශවයක් ලිඛිත දේශන ඉදිරිපත් කිරීමට අදහස් කරන්නේ නම් එකී ලිඛිත දේශන නියෝගයට සති තුනකට පෙර කාර්යාලයට ගොනු කිරීමට නියම කරන ලදී.

ඒ අනුව ඉදිරි දිනයේ දිනය 3 වන චූදිතගේ ස්වෙච්චානුගතභාවය සම්බන්ධ නියෝගය හා 6 වන ස්වෙච්චානුගතභාවය සම්බන්ධ අතුරු පරීක්ෂණය ආරම්භ කරන බවට දැනුම් දෙන ලදී.

එබැවින් පැ.ස 46ට සිතාසි නිකුත් කිරීමට නියෝග කරන ලදි.

3. **Any significant observations inside court room and outside?** නැත

**4. Next date & time: 2024.01.28**